

ඔබ ආස විදිහ......
පින්සල් පාර නොපෙනෙන්න
මටසිලිටි ලෙස පින්තාරු කල
නිවැරදි වර්ණ සංකලන යොදා
රිදී රාමුවක කොටුකල සිතුවම.

මම ආස විදිහ.....
එහෙන් මෙහෙන් පාටකල
වැරදි තැන් මකා සකස් කල
තව තවත් වැරදෙන්න ඉඩ තියෙන
රාමුවෙන් ගැලවූ කළු සුදු සිතුවම

**වර්ණ රසිකා ගුණවර්ධන**




1997 ජනවාරි 20 දින මුලතිව් උතුරු මුහුදේදී අතුරුදහන් වූ Y-12 යානයේ සහායක නියමු ප්‍රසන්න වෙත්තසිංහ මා එකම සොහොයුරා වෙනුවෙනි.

විසි වසක් පුරාවට
මග බලා සිටියා
අද එයි ඔබ
හෙට එයි ඔබ

කඳුළු හංගා ලොවට
සිනහවෙන් සරසා වුවන
කිසිවෙකුත් නොදකින
බුර බුරා නගින
ගිනි දැල් පපු කුහර තුළ

කොතැන සිටියත් ඔබ
සවිය ගන් ම'පුත
දිරිය ගන් ම'සොයුර

දෙවිඳු ඔබ - අප සමග
මොහාත පැමිණෙන තෙක්
අපි,

තාමත් මග බලාන............

ආදර අම්මි, ෆ්ලොරන්ස්, නැගණියන් දෙදෙනා ඇතුළු පවුලේ සැම.

**ප්‍රසාදිනී වෙත්තසිංහ.**

## මුහුණු පොත පිටු අතර

නිසල රැය මැදියමේ
ලොව නිදන කණිසමේ
ගෙවී මැකෙනා දිනේ
අටුවාව සොයමිනේ

හුරු පුරුදු අසුන මත
වඩා හිඳ විඩා ගත
එදා දින මතක වත
වමාරා විකන විට

මා නොදැන මගෙ දැහැන
බිඳී විසිරී පැතිර
දිවෙයි නිදි වරන නෙත
පරිගණක තිරය වෙත

මව තුරුල උණුසුමට
දුව ඇදෙන බිළිඳෙකුව
ගොඩ වදිමි එක සැනෙක
සයිබර් අවකාශයට

සියලු දන රජ දහන
සිතැඟි මන දොළ පුරන
මුහුණු පොත පිටු අතර
සැරිසරමි අයා නෙත

අරමුණක් නැති නමුදු
අත දිවෙයි පුරුදු ලෙස
විසිර යන පිටු අතර
සිත දිවෙයි මතකයට

එකක් පරයා එකක්
පෙළ ගැසෙන ප්‍රතිබිම්බ
කිසිත් නොදොඩා කියති
ගතවූ ජීවිත පුවත

කාලයේ රොඩු බොරඬු
ගොඩගැසුනු මඟ දෙපස
නොතිත් ආසා පැතුම්
වියලි පරඬැල් අකුල

බිඳ වැටුනු සබඳතා
රලු පරලු ගල් අතර
ශේෂ වුන බිම් මලකි
කාලයට හසු නොවුන

සියක් දහසක් වරක්
දෑස ගැටුන ද ඉහත
දකිමි තව වරක් එම
දසුන හදවත ඇඳුන

**ප්‍රේමවංශ දසනායක**

## නන්දා ....
## රුවන් නෙලු

ඇන්දා වු සිතුවම් අහස හිමිකරු හිරුද ළා සඳුද
රන්දා ආදරේ බිඝෙෂන රළ ළඟ වෙරළ නිහඬමද
කැන්දාන එන්නට වරම් නැති හිත අතැර යා යුතුද
නන්දාට ආදරේ දෙන්න පුළුවන් පියල්ට විතරමද

උස් මතක රැඳි රූමස්සලින් බැස දේදුණුත් හංගා
ඉස්පාසුවක් නැති ඉරක් දිව රෑ දෙපස දිවු හන්දා
බස් ප්‍රේම සිහිනයෙ සැතපුණා මිස නින්ද නොම බින්දා
හිස් අහස නොව මා විදුලියයි සැණෙනින් මැකෙන නන්දා

ගී කියන සියොතුනි සිය දහක් මැද සොඳුරු වන චෑන්දා
ඈ නොඑන බැව් යළි යළිත් නොකියන් සිතක සැක අන්දා
ගෝපී ලියන් පන්සියක් කුමකට සිටින තැන රාධා
මේ සිහිනයේ සිව්වැනිව දැවටෙමිඃ සිත නුඹටමයි නන්දා




## තරහ ගනු එපා කිසිදින

| | |
|---|---|
| එක බඩවැල කඩාගන ආවත් | දරුවන් |
| කෝපෙන් වියරුවී හිඳිනව ලෙස | මරුවන් |
| මනුලොව උපත ලදමුත් තිබිලා පෙර | පින් |
| සිතනුයෙ පතනුයේ කෙලෙසද ලෙස | තිරිසන් |
| | |
| වෛරය සිත දරන් හොඳ නැහැ නොවැ | ඉන්න |
| මමනම් වෛර නැහැ කිසිවෙකු | සමගින්න |
| මරණය රැගෙන ආ අපි එය | දැනගන්න |
| මැරුණ කෙනෙකු ගැන සිහියට | අරගන්න |
| | |
| ලස්සන රුවක් ලැබ මනු ලොව | ඉපදෙන්න |
| පහන් සිතින් නිතරම ජීවත් | වෙන්න |
| කෝපය ආ නමුදු හදවත | රිදවන්න |
| මියෙන බව සිතා කෝපය | දුරලන්න |
| | |
| මමයි ජගතා බලවත් එක්කෙනත් | මමයි |
| සිතාගෙනම අනෙකා පාගනු | නරකයි |
| අද බලවතා මතු අත්භව දුබලය | වෙයි |
| මේ ගැන සිතා සිත සනහා ගනු | කදිමයි |
| | |
| මෙත්තා කරුණ මුදිතා සිත තුලට | අරන් |
| සිටිනා තුරා අපි මනුලොව සිත්හි | දරන් |
| සිටිනට හැකි වේද කාහට වුවද | පහන් |
| ඔහු වෙයි බලවතා හදවත නිවුන | සහන් |

**දයා මානෙල් සෙනෙවිරත්න**
සමස්ත ලංකා කවි සම්මේලනය
සහ අ.ත.ක.ස.හි.
ඩවිටන්.

## ඇගයිය යුතුයි ඇති අගයක් තියෙන අය

| | |
|---|---|
| ඇති අය හැකියාව ඒවා ගැන | දන්න |
| නැති වෙන්නට නොදී ඕනෑ රැක | ගන්න |
| ගති පැවතුම් ඇතත් තැන තැන | දොඩවන්න |
| තුති පුදදෙමින් ඒ අය සමගින් | ඉන්න |
| | |
| ඇගයිය යුතුයි ඇති අගයක් | තියෙන අය |
| නොනැගිය යුතුයි මැසිවිල්ලේ | දහම දිය |
| වැලගිය දෙසට මැහි ගහමින් | දවන අය |
| වලිගය සපා මුව සරසයි | සිනහ ළය |

**ඩේසි ඒ සිල්වා**
නරෙවොරන්